(54)

000994

AL/2020/48/STE-I(NEW/OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

**NEW/OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I
கிரேக்க, உரோம நாகரிகம் I
Greek and Roman Civilization I

48 STE I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය / சுட்டெண் / Index No ..............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.
பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும்.
**For Examiner's use only.**

| ප්‍රශ්න අංක<br>வினா இல.<br>Question No. | ලකුණු<br>புள்ளிகள்<br>Marks |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව<br>மொத்தம்<br>Total | |

| | අත්සන<br>கையொப்பம<br>Signature | සංකේත අංකය<br>குறியீட்டு எண்<br>Code Number |
|---|---|---|
| 1 වන පරීක්ෂක<br>1 வது பரீட்சகர்<br>1st Examiner | | |
| 2 වන පරීක්ෂක<br>2 வது பரீட்சகர்<br>2 nd Examiner | | |
| අතිරේක / ප්‍රධාන පරීක්ෂක<br>மேலதிக / பிரதான பரீட்சகர்<br>Additional/Chief Examiner | | |
| ගණිත පරීක්ෂක<br>எண்கணிதப் பரிசோதகர்<br>Arithmetic Checker | | |
| ප්‍රධාන පරීක්ෂක<br>பிரதான பரீட்சகர்<br>Chief Examiner | | |

07070000280110794

[2 වැනි පිටුව බලන්න/பக். 2 ஐப் பார்க்க/See page two

## (48) ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය I

උපදෙස්:

※ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
※ I කොටසෙහි 1 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.
※ II කොටසෙහි 31 සිට 50 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති තිත්ඉර මත ලියන්න.
※ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු එක් භාෂාවකින් පමණක් සැපයිය යුතුයි.

### I කොටස - ග්‍රීක හා රෝම ඉතිහාසය

**1.** පුරාවෘත්තයන්ට හෝ සම්ප්‍රදායට අනුව, ඇතන්ස් පිහිටුවන ලද්දේ,
(1) පෙලොප්ස් (Pelops) විසිනි.
(2) සෙක්රොප්ස් (Cecrops) විසිනි.
(3) කැඩ්මස් (Cadmus) විසිනි.
(4) ආර්ගස් (Argus) විසිනි.
(5) ඩානුස් (Danus) විසිනි. (......)

**2.** ට්‍රෝජන් යුද්ධයට අදාළ පුරාවෘත්තයන්හි සඳහන් වන වීරයන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් වැරදි වාක්‍යය වන්නේ පහත සඳහන් වාක්‍ය අතුරින් කවරක්ද?
(1) ඉලියාඩ් (*Iliad*) සහ ඔඩිසි (*Odyssey*) කාව්‍යයන්හි ඔවුන්ගේ වීර ක්‍රියා පිළිබඳව සඳහන් කර ඇත.
(2) අවුරුදු දහයක් පමණ වූ ඔඩිසියස්ගේ (Odysseus') සංචාරය පිළිබඳ කථාව ඔඩිසි (*Odyssey*) කෘතියේ සඳහන් වෙයි.
(3) ඔඩිසියස් (Odysseus) ඉතාකා (Ithaca) වෙත නැවත පැමිණීමත් ඔහු පෙනලෝපීගෙන් (Penelope) විවාහය පතා පැමිණියවුන්ගෙන් පලිගැනීමත් පිළිබඳ කථාව ඔඩිසි (*Odyssey*) කෘතියට පාදක වෙයි.
(4) මෙනලායස් (Menelaus) ස්පාර්ටාවට (to Sparta) නැවත පැමිණීමත් ඔහුගේ රාජධානිය ප්‍රතිෂ්ඨාපනය කිරීමත් පිළිබඳ කථාව ඉලියාඩ් (*Iliad*) කෘතියේ සඳහන් වෙයි.
(5) ට්‍රෝජන්වරුන්ට විරුද්ධව ග්‍රීකයින් ඇතැම් ඔලිම්පියානුවන්ගේ අනුග්‍රහය සහිතව සටන් කල ආකාරය පිළිබඳ කථාව ඉලියාඩ් (*Iliad*) කෘතියේ සඳහන් වෙයි. (......)

**3.** ඩ්‍රෙකෝගේ (Draco's) නීති සම්පාදනයට මුල් වූ ඇතන්ස්හි (in Athens) පැවති වාතාවරණය සම්බන්ධයෙන් වැරදි වාක්‍යය කවරක්ද?
(1) ඇතන්ස් රාජ්‍යයේ ලියා තබන ලද නීති සංග්‍රහයක් නොවීය.
(2) ඇතීනියානු විනිශ්චයකරුවන්ගේ තීරණ පාලනය කිරීමේ පටිපාටියක් ඇතන්ස්හි නොවීය.
(3) සාමාන්‍ය ජනයා විසින් ඇතන්ස් රාජ්‍යයේ නීති සම්පාදනය පාලනය කරන ලදී.
(4) ජනතාවට ඇතන්ස් රාජ්‍යය තුළදී සාධාරණයක් ඉටු නොවීය.
(5) දුෂ්ට විනිශ්චයකරුවන් ඇතීනියානු පොදු ජනතාව පීඩාවට පත් කලහ. (......)

**4.** පහත වගුවේ පළමුවන තීරුවේ ඇතීනියානු පංති ඔවුන්ගේ ධනය අනුව බෙදී ඇති ආකාරයත් දෙවන තීරුවේ ඒවායේ අර්ථයනුත් දක්වා ඇත.

| පළමුවන තීරුව | දෙවන තීරුව |
|---|---|
| පෙන්ටකොසියෝමෙඩිම්නි *Pentacosiomedimni* | A – ඉරිඟු මිනුම් දෙසියයක් නිපදවූ ඉඩම් හිමියන් |
| හිප්පේස් *Hippes* | B – ඉරිඟු මිනුම් පන්සියයක් නිපදවූ ඉඩම් හිමියන් |
| සියුගිටායි *Zeugitae* | C – තමන්ගේම ඉඩමක් තිබුණත් දේශපාලන අයිතිවාසිකම් නොමැති ගොවීන් |
| තේටේස් *Thetes* | D – ඉරිඟු මිනුම් තුන්සියයකට වඩා වැඩි නමුත් පන්සියයකට වඩා අඩුව නිපද වූ ඉඩම් හිමියන් |

පළමුවන තීරුවේ දක්වා ඇති ඇතීනියානු පංති, දෙවන තීරුවේ සඳහන් නිවැරදි අර්ථය සමග ගළපා ඇති වරණය තෝරන්න.
(1) A, C, B, D (2) B, C, A, D (3) B, D, A, C (4) C, B, A, D (5) D, B, C, A (......)



0007097

- පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරින් 5 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - ඔහු ආර්කන්වරු (Archons) පත් කිරීමට බලපෑම් කළේය.

B - ඔහු හිස් ඉඩම් කොටස්වලට බෙදා ඉඩම් අවශ්‍යතාවය වැඩියෙන්ම තිබූ අය අතර බෙදා දුන්නේ ය.

C - ඔහු කඳුකර වැසියන්ගෙන් සමන්විත අළුත් පන්තියක් (Diakrioi) සංවිධානය කළේය.

000994

5. ඉහත A, B සහ C හි සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කළේ පහත සඳහන් පුද්ගලයින් අතරින් කවරෙක්ද?
   (1) සයිලෝන් (Cylon)
   (2) පිසිස්ට්‍රටස් (Peisistratus)
   (3) හිපාර්කස් (Hipparchus)
   (4) හිපියාස් (Hippias)
   (5) ඇරිස්ටියෝන් (Aristeion) (……)

6. මෙසීනියානු යුද්ධවල ප්‍රතිඵලය වඩාත් හොඳින් නිරූපණය වන්නේ පහත සඳහන් කුමන වාක්‍යයේද?
   (1) නෙයෝඩමොඩේස් (*neodamodes*) නමින් නිදහස් වූවන්ගේ පංතියක් බිහිවීම.
   (2) වරප්‍රසාද ලත් පංතිවල බලය බෙහෙවින් අඩපණ වීම.
   (3) හෝප්ලයිට් (hoplite) යුද්ධ උපක්‍රමවල වැදගත්කම හඳුනා ගැනීම.
   (4) ඇරිස්ටෝමිනීස්, මෙසීනියන්වරුන්ගේ (Messenians') පුරාවෘත්තයන්හි සඳහන් වීරයා බවට පත්වීම.
   (5) ස්පාර්ටන්වරුන්ගේ ඉඩම් ප්‍රශ්ණය සදාකාලිකවම විසඳීම. (……)

- පහත දැක්වෙන වාක්‍ය යුගල් කට්ටල කියවා ප්‍රශ්න අංක 7 ට පිළිතුරු සපයන්න.

A (i) - මේලියානු ග්‍රීක (Malian Greek) ජාතිකයකු වන එෆියල්ටේස් (Ephialtes) ග්‍රීසිය පාවාදුන් තැනැත්තා ලෙස ප්‍රචලිත විය.

(ii) - ස්පාටන්වරු (Spartans), තීබන්වරු (Thebans) සහ තේස්පියන්වරු (Thespians) රැඳී සිටියදී සෙසු ග්‍රීකයෝ දකුණු දෙසට පිටත් වූහ.

B (i) - ඇක්‍රොපොලිස් හි බිඳවැටීමෙන් පසු ග්‍රීක ජනරාල්වරු යුද්ධ මණ්ඩලයක් පවත්වා කොරින්තියානු ඉස්ත්මස් (Isthmus of Corinth) වෙත පසු බැසීමට තීරණය කළහ.

(ii) - ග්‍රීකවරුන් රාත්‍රියේ යාත්‍රා කිරීමට සූදානම් බවත් එය වැලැක්වීමෙන් සර්ක්සීස්ට (to Xerxes) විශාල ජයග්‍රහණයක් ලැබෙනු ඇති බවත් සිසිනස් (Sicinnus) නම් දාසයා දැනුම් දුන්නේය.

C (i) - පොසානියාස් (Pausanias) මෙහෙයවූ ඒකාබද්ධ ග්‍රීක හමුදාව මාර්ඩෝනියස් (Mardonius) මෙහෙයවූ පර්සියානු හමුදාව පරාජයට පත්කරන ලදී.

(ii) - මෙම සටන පර්සියානුවන්ගේ ග්‍රීක ආක්‍රමණ අවසන් කළ ප්‍රධාන ගොඩබිම් සටන්වලින් එකකි.

7. තර්මොපිලේ (Thermopylae), සලාමිස් (Salamis), සහ ප්ලැටෙයා (Plataea) සටන් අනුපිළිවෙළට නිවැරදි ව සඳහන් වන වරණය කුමක් ද?
   (1) A, B, C (2) B, A, C (3) B, C, A (4) C, A, B (5) C, B, A (……)

8. මැරතන්හිදී (Marathon) මිල්ටියාඩීස් (Miltiades) සහ ග්‍රීකයින් භාවිත කළ උපාය මාර්ගයක් ඇතුළත් නොවන්නේ පහත සඳහන් කුමන වරණයේ ද?
   (1) අශ්වාරෝහක හමුදාව පර්සියානුවන් යටපත් කිරීමට යොදාගන්නා ලදී.
   (2) පර්සියානුවන් රැවටීමට හමුදාවේ මධ්‍යය දුර්වල කිරීම.
   (3) ෆැලැන්ක්ස් (Phalanx) කණ්ඩ සෑදීම නම් යුධ උපක්‍රමය බහුලව භාවිත කළහ.
   (4) කඳු දෙකක් අතර ප්‍රදේශයක සටනේ යෙදීම.
   (5) උසස් තත්වයේ අවි-ආයුධත් යුධ උපක්‍රමත් එකට භාවිත කිරීම. (……)

9. සිමොන් (Cimon) ක්‍රි.පූ. 461 දී පලවා හරිනු ලැබුවේ,
   (1) ඩිලොස් මණ්ඩලය (Confenderacy of Delos) පිහිටුවීම නිසාය.
   (2) ස්පාර්ටන්වරුන් (Spartans) සමඟ සුහදත්වයක් පැවැත්වූ නිසාය.
   (3) ඇතන්ස්හි (in Athens) ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වීම නිසාය.
   (4) අවංක රාජ්‍ය නායකයකු ලෙස ඔහුට තිබූ ජනප්‍රියත්වය නැතිවීම නිසාය.
   (5) සම්ප්‍රදායික දේශපාලඥයකු වූ නිසාය. (……)

0607000028010794

[4 වැනි පිටුව බලන්න/பக். 4 ஐப் பார்க்க/See page four

● පහත සඳහන් ප්‍රකාශ සලකා බලා **10** සහ **11** වන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පෙරික්ලීස් (Pericles) විසින් ක්‍රි.පූ. 449 දී පැන්හෙලනික් (Panhellenic) සම්මේලනයක් කැඳවනු ලැබීය.

B - ක්‍රි.පූ. 447 දී ත්‍රේසියානු චෙර්සොනෙසස් (Thracian Chersonesus) හි පෙරික්ලීස් (Pericles) විසින් ක්ලෙරුකි ජනපද (cleruchies) පිහිටුවන ලදී.

C - පෙරික්ලීස් (Pericles) විසින් ග්‍රීක ජනපද තුළ ඇතීනියානු කාසි භාවිතය නියම කරන ලදී.

D - පෙරික්ලීස් (Pericles) විසින් පර්සියානුවන් විනාශ කල ඇතීනියානු දේවාල සහ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කරවන ලදී.

**10.** පෙරික්ලීස්ගේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියේ (Pericles' imperial policy) මුල් සලකුණු පෙන්නුම් කෙරෙන ප්‍රකාශ දෙක ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D (……)

**11.** පෙරික්ලීස්ගේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියේ (Pericles' imperial policy) ප්‍රතිඵල පෙන්නුම් කෙරෙන ප්‍රකාශ දෙක ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D (……)

**12.** සිසිලියානු ආක්‍රමණයේදී (Sicilian Expedition) ඇතන්ස් (Athens) රාජ්‍යය අසමත් වූයේ,

(1) ඇල්සිබියාඩීස් (Alcibiades) ආක්‍රමණය පාවා දුන් නිසා ය.
(2) ඇතීනියානුවන් (Athenians) පසු බැසීම ප්‍රතික්ෂේප කළ නිසා ය.
(3) ස්පාර්ටා රාජ්‍යය ඇතීනියානු නාවික බලඇණිය විනාශ කළ නිසා ය.
(4) සිසිලි රාජ්‍යයට අතිරේක බලඇණි ලැබුණු නිසා ය.
(5) ස්පාර්ටා රාජ්‍යයට පර්සියානු සහය ලැබුණු නිසා ය. (……)

**13.** ග්‍රීක රාජ්‍යයන් පෙලොපොනේසියානු යුද්ධයේදී (Peloponnesian War) එකිනෙකාට එරෙහිව සටන් කලහ. එම යුද්ධයේ දිගු කාලීන බලපෑමක් වන්නේ කුමක් ද?

(1) තීබ්ස් රාජ්‍යය ස්පාර්ටාව පරාජය කිරීම.
(2) මැසිඩෝනියාව ග්‍රීසිය යටත් කර ගැනීම.
(3) පර්සියාව ඇතන්ස් රාජ්‍යය නතු කර ගැනීම.
(4) ස්පාර්ටාව ඇතන්ස් රාජ්‍යය අත්පත් කර ගැනීම.
(5) ආර්ගෝස් රාජ්‍යය මෙගාර රාජ්‍යය පරාජය කිරීම. (……)

**14.** මැසිඩෝනියාවේ දෙවන ෆිලිප් (Philip II) රජුගේ යුධ කටයුතු ගැන දැක්වෙන පහත සඳහන් ප්‍රකාශය සහ හේතුව කියවා ඒවා පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.

ප්‍රකාශය - මැසිඩෝනියාවේ දෙවන ෆිලිප් (Philip II of Macedonia) රජු ඇතන්ස් වෙනුවෙන් ඇම්ෆිපොලිස් (Amphipolis) යටත් කර ගැනීමට කටයුතු කළේය.

හේතුව - නිදහස් රාජ්‍යයක් වන පිඩ්නා (Pydna) රාජ්‍යය මැසිඩෝනියාවේ දෙවන ෆිලිප් (Philip II of Macedonia) රජුට යටත්කර දීමට ඇතන්ස් පොරොන්දු වීම.

(1) ප්‍රකාශය සහ හේතුව යන දෙකම නිවැරදි වන අතර ඒවා එකිනෙකට සම්බන්ධ වේ.
(2) ප්‍රකාශය සහ හේතුව යන දෙකම නිවැරදි නමුත් ඒවා එකිනෙකට සම්බන්ධ නොවේ.
(3) ප්‍රකාශය පමණක් නිවැරදි වන අතර හේතුව වැරදිය.
(4) ප්‍රකාශය වැරදියි, හේතුව නිවැරදිය.
(5) ප්‍රකාශය සහ හේතුව යන දෙකම වැරදිය. (……)

**15.** මහා ඇලෙක්සැන්ඩර් රජු (Alexander the Great),

(1) ක්‍රි.පූ. 336 දී පවුසානියස් (Pausanians) නම් පුද්ගලයකු අතින් ඝාතනය විය.
(2) කඳුකර ගෝත්‍රිකයන් සහ මැසිඩොනියානුවන් එක්සේසත් කළේය.
(3) කොරින්තියේ ග්‍රීක සම්මේලනය (Confederacy at Corinth) මගින් ග්‍රීසියේ ජෙනරාල්වරයා ලෙස තෝරා ගන්නා ලදී.
(4) ජෙනරාල් ඇටලස්ගේ (General Attalus') ලේලිය වන ක්ලියෝපැට්රා (Cleopatra) සමඟ විවාහ විය.
(5) හිපස්පිස්ටායි (*Hypaspistae*) නමැති විශේෂ බලඇණියක් සහ රාජකීය ආරක්ෂක බලකායක් නිර්මාණය කළේය. (……)

[5 වැනි පිටුව බලන්න/பக். 5 ஐப் பார்க்க/See page five

**16.** ඉතාලියේ මුල් ජාතීන් හතර සඳහන් වන්නේ පහත දැක්වෙන කුමන වරණයේ ද?
(1) ලැවීනියන්වරු (Lavinians), කෙල්ට්ස්වරු (Celts), ග්‍රීකවරු (Greeks), සැබැයින්වරු (Sabines)
(2) එට්රුස්කාන්වරු (Etruscans), ස්පැනියාඩ්වරු (Spaniards), සැබැයින්වරු (Sabines), ලැට්වියන්වරු (Latvians)
(3) අම්බ්‍රියන්වරු (Umbrians), කාර්තජිනියන්වරු (Carthaginians), කොරින්තියන්වරු (Corinthians), ග්‍රීකවරු (Greeks)
(4) ලැපිජියන්වරු (Lapygians), ගෝල්වරු (Gauls), එට්රුස්කාන්වරු (Etruscans), ලිගුරියන්වරු (Ligurians)
(5) වොල්ස්කියන්වරු (Volscians), ලතින්වරු (Latins), ලැවීනියන්වරු (Lavinians), සුමේරියන්වරු (Summerians) (……)

000994

**17.** පහත දැක්වෙන හේතු අතුරෙන්, රෝම රාජාණ්ඩුව බිඳ වැටීමට පාදක වූ හේතූන් දෙක ඇතුළත් වරණය තෝරන්න.
A - ටාර්ක්වීනියස් සුපර්බස්ගේ (Tarquinius Superbus') පීඩාකාරී පාලනය
B - සැබැයින්වරියන් (Sabines) දූෂණය කිරීම.
C - ලුක්රේෂියා (Lucretia) දූෂණය වීම.
D - ප්ලෙබෙයින්වරුන්ගේ (Plebeians) නැඟී සිටීම.
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) C සහ D (……)

**18.** පහත වගුවේ පළමු තීරුව මඟින් රාජ්‍ය නිලධාරීන් ද දෙවන තීරුව මඟින් ඔවුන්ට පැවරී තිබුණු රාජකාරි ද දැක්වේ.

| රාජ්‍ය නිලධාරීන් | පැවරුණු රාජකාරි |
|---|---|
| කොන්සල්වරයා (Consul) | A - රෝමන්වරුන් සිවිල් යුක්තියට නතු කිරීම. |
| ප්‍රයටර්වරයා (Praetor) | B - ප්ලෙබෙයින්වරුන් වැරදිවලින් ආරක්ෂා කර ගැනීම. |
| සෙන්සර්වරයා (Censor) | C - පොදු උත්සව පාලනය කිරීම. |
| ක්වෙස්ටර්වරයා (Quaestor) | D - ආදායම් රැස් කිරීම. |
| ඊඩයිල්වරයා (Aedile) | E - හමුදාවට අණ දීම. |
| | F - සෙනට් සභාවේ පුරප්පාඩු පිරවීම. |

රාජ්‍ය නිලධාරීන්ට අනුව ඔවුන්ට පැවරී තිබුණු රාජකාරි නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.
(1) A, D, B, E, C (2) B, D, A, F, C (3) C, B, F, A, E (4) D, A, E, C, B (5) E, A, F, D, C (……)

**19.** කොමිටියා ට්‍රිබියුටාවට *(Comitia Tributa)* රජයේ උසස්ම අධිකරණ බලය ලබා දුන් නීතිය සඳහන් වන වරණය කුමක් ද?
(1) ලෙක්ස් කැනුලෙයියා (Lex Canuleia)
(2) ලෙක්ස් ඔගුල්නියා (Lex Ogulnia)
(3) ලෙක්ස් හෝර්ටෙන්සියා (Lex Hortensia)
(4) වැලේරියෝ-හොරේෂියානු නීති (Valerio-Horatian Laws)
(5) ලිසීනියානු නීති (Licinian Laws) (……)

- පියුනික් යුද්ධය පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ කියවා **20** සිට **22** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - හැනිබල් විසින් ටියුරින් (Turin) අත්පත් කරගැනීම.
B - සිසිලිය (Sicily) රෝම ප්‍රාන්තයක් බවට පත්වීම.
C - නියුමිඩියන් රජ (King Numidia) කාර්තේජ්යට ප්‍රහාර එල්ල කිරීම.
D - රෝමන්වරු කැනායි (Cannae) සටනේ දී පරාජය වීම.
E - හැනිබල් විසින් රෝමන්වරු මෙටව්රස් (Metaurus) සටනේදී පරාජය කිරීම.

**20.** ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් පළමු පියුනික් යුද්ධ (First Punic War) කාල සීමාවේ සිදු වූ සිද්ධියක් වනුයේ කුමක් ද?
(1) A (2) B (3) C (4) D (5) E (……)

**21.** ඉහත දැක්වෙන ප්‍රකාශ අතුරින් දෙවන පියුනික් යුද්ධය (Second Punic War) පිළිබඳව සඳහන් කරන ප්‍රකාශ දෙක කවරේ ද?
(1) A සහ C (2) A සහ D (3) B සහ C (4) B සහ E (5) D සහ E (……)

05070000280110794

[6 වැනි පිටුව බලන්න/பக். 6 ஐப் பார்க்க/See page six

**22.** ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් කුමන සිදුවීම තෙවන පියුනික් යුධ (Third Punic War) කාල සීමාවේ සිදු වූවක් ද?
(1) A (2) B (3) C (4) D (5) E (......)

**23.** පහත සඳහන් ප්‍රකාශ අතරින් ග්‍රැකයි සහෝදරයින්ගේ (Gracchi brothers') ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ප්‍රකාශ දෙක ඇතුළත් වරණය කුමක් ද?

A - කිසිවෙකුටත් යුගේරා 300 ට වඩා වැඩි බිම් ප්‍රමාණයක් ගැනීමට අයිතියක් නොවීය.
B - අතිරික්ත බිම් ප්‍රමාණය දුප්පත් ජනයාට බෙදා දිය යුතුය.
C - සෙනට් සභාවේ අවසාන තීන්දුව සම්බන්ධයෙන් අභියාචනය කිරීමට අයිතියක් තිබිණ.
D - සෙබළුන් තමන්ගේම වියදමින් අවශ්‍ය ආයුධ සහ මෙවලම් සපයා ගත යුතුය.

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D (5) C හා D (......)

**24.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ජුගුර්තා (Jugurtha) පිළිබඳ වැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඔහුට නියුමිඩියාවේ පරමාධිපත්‍යය ලබා ගැනීමට අවශ්‍ය විය.
(2) ඔහු ඇඩ්හබාල්ව (Adherbal) සටන් වැද පරාජය කළේය.
(3) ඔහු රෝමානු කොමසාරිස්වරු අල්ලසට ගත්තේය.
(4) අවසානය තෙක් පාක්ෂික බොක්කස්ගෙන් (Bocchus) ඔහුට උපකාර ලැබිණි.
(5) ඔහු සාගින්නෙන් ඇදිරියක් තුළ මිය ගියේය. (......)

**25.** වරදකරුවෙකු කර නෙරපා ඝාතනය කිරීමේ නව ක්‍රමයක් රෝමයට හඳුන්වා දුන්නේ කවුද?
(1) ටයිබීරියස් ග්‍රැකස් (Tiberius Gracchus) (2) ගායස් ග්‍රැකස් (Gaius Gracchus)
(3) කේටෝ (Cato) (4) මේරියස් (Marius)
(5) සුල්ලා (Sulla) (......)

**26.** ග්ලැඩියේටර්වරුන්ගේ අරගල (Gladiatorial revolts) පිළිබඳව නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් වරණය කුමක් ද?

A - ග්ලැඩියේටර්වරුන්ගේ කැරැල්ලක් කැපුවා (Capua) වලින් පටන් ගැනින.
B - සුප්‍රසිද්ධ ස්පාර්ටකස් ග්ලැඩියේටර්වරයා ස්පාර්ටන්වරයෙක් විය.
C - ක්‍රැසස් (Crassus) විසින් ස්පාර්ටකස්ගේ කැරැල්ල අවසන් කළේය.
D - දිවි රැකගත් කැරැලිකරුවන් ජූලියස් සීසර් (Julius Caesar) විසින් ඝාතනය කරන ලදී.

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D (5) C හා D (......)

**27.** කැටිලිනාට මරණ දණ්ඩනය නොදී, ජීවිතාන්තය දක්වා හිර අඩස්සියේ තැබීමට යෝජනා කළේ කවුරුන් විසින් ද?
(1) ක්‍රැසස් (Crassus) (2) පොම්පේ (Pompey) (3) සීසර් (Caesar)
(4) ඇන්තනි (Anthony) (5) සිසරෝ (Cicero) (......)

**28.** පහත සඳහන් සිද්ධීන් සිදුවූ කාල වකවානු අනුපිළිවෙලට දක්වා ඇති වරණය තෝරන්න.

A - සීසර් (Caesar) රූබිකොන්වලින් (Rubicon) එතෙර වීම.
B - ලූකාවල (Luca) සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
C - ක්‍රැසස් (Crassus) සහ ජූලියාගේ (Julia) මරණය සිදුවීම.
D - ෆර්සාලියාහිදී (in Pharsalia) පොම්පේ (Pompey) පරාජය වීම.

(1) A, D, B, C (2) B, C, A, D (3) C, A, D, B (4) C, D, B, A (5) D, A, B, C (......)

**29.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් ජූලියස් සීසර්ගේ (Julius Caesar's) ප්‍රතිසංස්කරණයක් ඇතුළත් **නොවන** වරණය කුමක් ද?
(1) ජූලියස් සීසර් සෙනට් සභිකයින් 800 දක්වා වැඩි කළේය.
(2) ඔහු කාර්තේජ් (Carthage) සහ කොරින්ත්හි (Corinth) ජනපද පිහිටුවිය.
(3) ඔහු ගෝල් (Gaul) ප්‍රදේශයේ සහ ස්පාඤ්ඤයේ (Spain) සමහර නගරවල වැසියන්ට පුරවැසිභාවය ලබා දුන්නේය.
(4) ඔහු පොලී අනුපාතය අඩු කිරීමෙන් ණයකරුවන්ට සහනයක් ලබා දුන්නේය.
(5) ඔහු දුප්පතුන්ට ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිතව රැකියා ලබා දුන්නේය. (......)

**30.** ඔගස්ටස් සීසර් (Augustus Caesar) සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතරින් **සාවද්‍ය** වන්නේ කුමක් ද?
(1) ඔහු "රජ" පදවිය ප්‍රතික්ෂේප කළේය.
(2) ඔහු ඉම්පෙරාටෝර් *(Imperator)* පදවිය භාර ගත්තේය.
(3) ඔහුව සෙනට් සභාවේ මුලසුනට පත් කළේය.
(4) පොන්ටිෆෙක්ස් මැක්සිමස් *(Pontifex Maximus)* පදවිය ඔහු ප්‍රතික්ෂේප කළේය.
(5) ඔහු සාම්ප්‍රදායික ප්‍රතිපත්තියෙන් යුතු විය. (......)

[7 වැනි පිටුව බලන්න/பக். 7 ஐப் பார்க்க/See page seven

## II කොටස - ග්‍රීක හා රෝම සාහිත්‍යය

● කෙටි පිළිතුරු සපයන්න.

**31.** හිසියඩ් (Hesiod) තම **වැඩපල හා දින නිමිති** කෘතියේ සඳහන් කරන පරිදි සියුස් (Zeus) නිර්මාණය කළ ප්‍රථම සහ අවසාන යුග සඳහන් කරන්න.

(i) ප්‍රථම යුගය ........................................

(ii) අවසාන යුගය ........................................

**32.** හිසියඩ්ගේ (Hesiod's) **වැඩපල හා දින නිමිති** කෘතියේ

(i) අතු පහක් සහිත පැලය ලෙසින් දක්වන්නේ කුමක් ද?

........................................

(ii) පිට මත තමාගේ නිවස ගෙනයන්නා යනුවෙන් හඳුන්වන්නේ කවු ද?

........................................

**33.** ඇරිස්ටොෆනීස්ගේ (Aristophanes') **බඹරු** නාට්‍යයේ

(i) ප්‍රෝක්ලියෝන්ව (Procleon) සිය නිවස තුළ සිර කළේ කවු ද?

........................................

(ii) ඒ ඇයි?

........................................

**34.** ඇරිස්ටොෆනීස්ගේ (Aristophanes') **බඹරු** නාට්‍යය ආරම්භයේදී සැන්තියාස් (Xanthias) දුටු සිහිනය සඳහන් කරන්න.

........................................

........................................

**35.** ඇරිස්ටොෆනීස්ගේ (Aristophanes') **බඹරු** නාට්‍යය ආරම්භයේදී ප්‍රෝක්ලියෝන් (Procleon) සඳහන් කරන 'නො-මෑන්' (No-Man) යන වදනින් අදහස් කරන මිත්‍යා කථාව කුමක් ද?

........................................

........................................

**36.** සොෆොක්ලීස්ගේ (Sophocles') **ෆිලොක්ටීටීස්** නාට්‍යයේ ෆිලොක්ටීටීස්ව (*Philoctetes*) ට්‍රෝයි (Troy) වෙත ගෙන ඒම සඳහා යැවූ පුද්ගලයින් දෙදෙනා කවුරුන්ද?

(i) ........................................

(ii) ........................................

**37.** සොෆොක්ලීස්ගේ (Sophocles') **ෆිලොක්ටීටීස්** නාට්‍යයේ නෙයොප්ටොලෙමස්ගේ (Neoptolemus') සොයා ගැනීම්වලට අනුව ෆිලොක්ටීටීස් (*Philoctetes*) ලෙම්නොස්හි (Lemnos) තවදුරටත් ජීවත් වන බව පෙන්වන සාක්ෂි දෙකක් සඳහන් කරන්න.

(i) ........................................

(ii) ........................................

**38.** සොෆොක්ලීස්ගේ (Sophocles') **ෆිලොක්ටීටීස්** නාට්‍යයේ,

(i) ෆිලෝක්ටීටීස්ට (*Philoctetes*) ට්‍රෝයි (Troy) රාජ්‍යයට යෑමට අණ කළේ කවුරුන් ද?

........................................

(ii) ඔහු ට්‍රෝයි වෙත යා යුත්තේ ඇයි?

........................................

[8 වැනි පිටුව බලන්න/பக். 8 ஐப் பார்க்க/See page eight

**39.** **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ පූර්විකාව ගෙන දැක්වීමට යුරිපිඩීස් (Euripides) යොදා ගෙන ඇති චරිත දෙක නම් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

**40.** යුරිපිඩීස්ගේ (Euripides') **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ ඇල්සෙස්ටිස් (Alcestis) තම මරණාසන්න මොහොතේදී ඇගේ සැමියාවූ ඇඩ්මිටස්ගෙන් (Admetus) ඉල්ලා සිටියේ කුමක් සිදු නොකරන ලෙසද?

..............................................................................................................

..............................................................................................................

**41.** යුරිපිඩීස්ගේ (Euripides') **ඇල්සෙස්ටිස්** නාට්‍යයේ තම බිරිඳගේ වියෝවෙන් නිවැසියන් වැළපෙමින් සිටියදී ආගන්තුකයෙකු නිවසට ගෙන සත්කාර කිරීමේ තම ක්‍රියාව ඇඩ්මිටස් ෆේරියානු නගරවැසියන්ගෙන් යුතු ගීතිකා කණ්ඩායමට සාධාරණීකරණය කරන්නේ කෙසේද?

..............................................................................................................

..............................................................................................................

**42.** යුරිපිඩීස්ගේ (Euripides') **ඇල්සෙස්ටිස්** නාට්‍යය අවසානයේ හෙරක්ලීස් (Haracles) 'පරිස්සම පිණිස තබා යෑමට' යැයි අඟවමින් ඇඩ්මිටස් (Admetus) වෙත කැඳවා ගෙන ආවේ කවරෙක් ද?

..............................................................................................................

..............................................................................................................

**43.** ටෙරන්ස්ගේ (Terence's) **නැන්දම්මාවරු** නාට්‍යයේ පූර්විකාව ගොඩනැගෙන්නේ එහි කුමන චරිත **තුන** අතර ඇතිවන සංවාදය තුළින් ද?

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

(iii) ..............................................................................................................

**44.** ටෙරන්ස්ගේ (Terence's) **නැන්දම්මාවරු** නාට්‍යයේ පැම්ෆිලස් (Pamphilus) තම බිරිඳට ආලය කරන්න පටන් ගන්නා විටම ඇයගෙන් වෙන්වීමට වූ සිදුවීම කෙටියෙන් සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

**45.** ටෙරන්ස්ගේ (Terence's) **නැන්දම්මාවරු** නාට්‍යයේ මිරිනාට (Myrrina) අනුව පැම්ෆිලස්ගේ (Pamphilus') නිවස හැරයාමට ෆිලූමිනාව (Philumina) පෙළඹවූ නියම හේතුව කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

**46.** ටෙරන්ස්ගේ (Terence's) **නැන්දම්මාවරු** නාට්‍යයේ,

(i) පැම්ෆිලස්ගේ (Pamphilus') වහල් සේවකයාගේ නම කුමක් ද?

..............................................................................................................

(ii) නාට්‍යය ආරම්භයේදී පැම්ෆිලස් (Pamphilus) හා ෆිලූමිනාව (Philumina) හැරුණු විට මොහු පමණක් දැන සිටි කථාවේ කොටස කුමක් ද?

..............................................................................................................

[9 වැනි පිටුව බලන්න/பக். 9 ஐப் பார்க்க/See page nine

**47.** ඇපොලෝනියස්ගේ (Apollonius') **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව වීරයින් කොල්කිස් (Colchis) බලා යාත්‍රා කිරීම ආරම්භ කරන මොහොතේදී,

(i) නැවේ මධ්‍ය අසුන ලබා දෙන ලද්දේ කාට ද?

..........................................................................................

(ii) ඔහුගේ සහායකයා ලෙසින් තෝරා ගත්තේ කාව ද?

..........................................................................................

000994

**48.** ඇපොලෝනියස්ගේ (Apollonius') **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව ආර්ගොනොට්වරුන් කොල්කිස් (Colchis) බලා යන ගමනේදී,

(i) පළමුවෙන්ම නැවැත්වූයේ කොහේ ද?

..........................................................................................

(ii) එහිදී නොනැවතී ගමන දිගටම යා යුතු බව ජේසන්ට (Jason) හා පිරිසට තරයේ කියා සිටියේ කවරෙක් ද?

..........................................................................................

**49.** ඇපොලෝනියස්ගේ (Apollonius') **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව ඇතීනා (Athena) සහ හේරා (Hera) ඇෆ්රොඩයිට්ගේ (Aphrodite's) මාළිගයට පැමිණියේ ඇයි?

..........................................................................................

..........................................................................................

**50.** ඇපොලෝනියස්ගේ (Apollonius') **ද වොයෙජ් ඔෆ් ආර්ගෝ** කාව්‍යයට අනුව නිවස බලා යන ගමනේදී ජේසන් (Jason) හා මීඩියා (Medea) හමුවීමට ගිය මීඩියාගේ නැන්දණියගේ නම කුමක් ද?

..........................................................................................

* * *

03070000280110794